සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2017 ජූලි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2017-07-15
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 රක්ෂණ ගිවිසුමක ප්‍රධාන මූලිකාංග වන්නේ:

(1) හානි පූරණය, වාරිකය සහ ආදේශනය.

(2) යෝජනාව, වාරිකය සහ වගකීම් මුක්ත කරවන වගන්ති.

(3) වාරිකය, අවිනිශ්චිතතාව සහ රක්ෂණමය හිමිකම.

(4) යෝජනාව, රක්ෂිතයාගේ ඉතිහාසය සහ වගකීම් මුක්ත කරවන වගන්ති.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකුණුම් ආඥා පනත යටතේ භාණ්ඩයක් ලෙස සලකනු **නොලබන්නේ** කුමක් ද?

(1) මෝටර් කාර් රථයක්.

(2) විකිණීමට පෙර ඉඩමෙන් කපා ඉවත් කරනු ලැබිය යුතු අස්වැන්නක්.

(3) ගොඩනැගිල්ලක්.

(4) ප්‍රකාශන අයිතියක්.

1.3 පහත සඳහන් රක්ෂණ වර්ග අතුරෙන්, හානි පූරණ මූලධර්මය අදාල **නොවන** රක්ෂණය තෝරන්න:

(1) ජීවිත රක්ෂණය. (2) ගිනි රක්ෂණය.

(3) මුහුදු රක්ෂණය. (4) සෞඛ්‍ය රක්ෂණය.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් වන්නේ කුමක් ද?

(1) විනිමය බිල්පතක්. (2) චෙක්පතක්.

(3) පොරොන්දු නෝට්ටුවක්. (4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව, ව්‍යංග කොන්දේසියක් **නොවන්නේ** කුමක් ද?

(1) භාණ්ඩ, විස්තරය සමග අනුකූල විය යුතුයි. (2) විකුණුම්කරුට විකිණීමට හිමිකමක් තිබේ.

(3) භාණ්ඩ, නියැදිය සමග අනුකූල විය යුතුයි. (4) භාණ්ඩ, කිසිම වෙනසකින් තොර විය යුතුයි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, නියෝජිතයෙකුගේ යුතුකමක් (duty) **නොවන්නේ** කුමක් ද?

(1) ප්‍රවේශමෙන් සහ නිපුණතාවයෙන් යුතුව ක්‍රියාකිරීමේ යුතුකම.

(2) නියමිත කාලයට කොමිස් මුදල් ලබාගැනීමේ යුතුකම.

(3) වගවීම පිළිබඳ යුතුකම.

(4) රහසිගත ලාභ ලබා නොගැනීමේ යුතුකම.

1.7 ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත කෙරෙන ගිවිසුම්වලට අදාල පහත සඳහන් ප්‍රකාශන සලකා බලන්න:

**(a)** FOB ගිවිසුමක් සාමාන්‍යයෙන් පිටත්වන වරායේ නම සමගින් දැක්වේ.

**(b)** FOB ගිවිසුම් යටතේ, පිටත්වන වරායේ නැංගුරම් ලා ඇති නැවකට භාණ්ඩ පැටවීමේ වගකීම විකුණුම්කරු වෙත පැවරේ.

**(c)** CIF ගිවිසුම් යටතේ, නැවට භාණ්ඩ පැටවීමේ පිරිවැය විකුණුම්කරු විසින් දැරිය යුතු වේ.

ඉහත ප්‍රකාශන අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.8 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලින් සලසා දී ඇති ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල දෙකක්(02) සඳහන් කරන්න.

1.9 පුද්ගල නීතිය (Personal Law) සහ ප්‍රාදේශීය නීතිය (Territorial Law) අතර වෙනස සඳහන් කරන්න.

1.10 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ [Board of Investment (BOI)] මූලික කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත A සහ B සමාගමේ** කොටස්හිමියන් සහ අධ්‍යක්ෂවරුන් වන්නේ **අමල්** සහ **බිමල්** යන දෙදෙනා පමණකි. **අමල්** සහ **බිමල්ගේ** මිත්‍රයෙකු වන **හේමාල්, සීමාසහිත A සහ B සමාගමේ** අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, **අමල්** සහ **බිමල්** විසින් **සීමාසහිත OM ලෑන්ඩ් ඩිවලොපර්ස් සමාගම** වෙත හඳුන්වා දෙන ලදී. කෙසේවෙතත්, සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහුව මෙතෙක් පත්කර නොතිබුණි. **හේමාල්, සීමාසහිත A සහ B සමාගම** උදෙසා **සීමාසහිත OM ලෑන්ඩ් ඩිවලොපර්ස් සමාගමෙන්** අධික මිල ඇති ඉඩමක් මිලදී ගන්නා ලදී. කෙසේවුවද, **සීමාසහිත A සහ B සමාගම,** එහි අධ්‍යක්ෂවරයෙකු ලෙස **හේමාල්** ව කිසිදාක පත් නොකළ බවද, ඉඩම මිලදී ගැනීමට ඔහුගෙන් කිසිදාක ඉල්ලා නොසිටි බවද කියමින් ඉඩම සඳහා ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. **සීමාසහිත OM ලෑන්ඩ් ඩිවලොපර්ස් සමාගම,** මුදල් අයකර ගැනීම සඳහා **සීමාසහිත A සහ B සමාගමට** එරෙහිව නඩු පවරා ඇත.

**හේමාල්** විසින් මිලට ගන්නා ලද ඉඩම සඳහා **සීමාසහිත A සහ B සමාගම** මුදල් ගෙවීම සඳහා වගකීමට යටත් වන්නේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

**ධනපාල** විසින් **ධනසිරිගේ** නමින් රු.100,000/- ක චෙක්පතක් ලියන ලදී. බැංකුකරුගේ නම සහ *"ගනුදෙනු කළ නොහැකිය"* යන වචන චෙක්පතේ මුහුණත හරහා ලියන ලදී. කෙසේවුවද, චෙක්පතේ අත්සන පැහැදිලි නොවූ අතර, ඉලක්කමෙන් වටිනාකම රු.100,000/- ක් ලෙස ලියා තිබූ අතර, අකුරු වලින් එය *"රුපියල් දසදහසක් පමණි"* යනුවෙන් ලියා තිබුණි. **ධනපාලගේ** ගිණුමේ ශේෂය ලෙස තිබුණේ රු.5,000/- ක් පමණකි.

මෙම චෙක්පත සම්බන්ධයෙන් බැංකුවේ වගකීම **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

### 04 වන ප්‍රශ්නය

ජාත්‍යන්තර වෙළඳාමේදී යොදාගනු ලබන ගෙවීම් ක්‍රමය සත්‍ය වශයෙන්ම වැදගත් සාධකයකි. එහි වෙනස් රටවල වෙනස් මුදල් වර්ග ඇතුළත් වේ. සාමාන්‍යයෙන් ජාත්‍යන්තර වෙළඳාමට අදාල සෑම ගිවිසුමකම ගෙවීම් ක්‍රමය පිළිබඳ දැක්වෙන වගන්තියක් ඇතුළත් වේ.

(a) ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත කෙරෙන ගෙවීම් ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) ඉහත (a) යටතේ දැක්වූ ගෙවීම් ක්‍රමවලින් එකක්(01) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 05 වන ප්‍රශ්නය

**බින්දු, සීමාසහිත JJ රක්ෂණ සමාගමෙන්** ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබාගන්නා ලදී. පසුගිය වර්ෂය තුළ තදබල අසනීපයකින් **බින්දු** පෙළුනේදැයි රක්ෂණ සමාගම **බින්දුගෙන්** විමසන ලදී. **බින්දු** මෑතකදී තදබල හෘද රෝගයකට ගොදුරු වී සැත්කමකට පවා භාජනය වී සිටි නමුදු රක්ෂණ නියෝජිතට හෝ ඔහුගේ ඉල්ලුම් පත්‍රයේ හෝ ඒ පිළිබඳ කිසිදු කරුණක් ඔහු අනාවරණය නොකළේය. කෙසේවෙතත්, රක්ෂණ ගිවිසුමට එළඹීමෙන් පසු, **බින්දු** නැවතත් හෘද රෝගයකට ගොදුරු වී සති කීපයකට රෝහල් ගතවී සිටියේය. ඒ අතරතුර **බින්දු** හෘද රෝගියෙකු බව රක්ෂණ සමාගමට දැන ගැනීමට ලැබී තිබූ අතර, **බින්දුගේ** හිමිකම් ඉල්ලීම (claim) ප්‍රතික්ෂේප කරන ලදී.

රක්ෂණ සමාගමට, **බින්දුගේ** හිමිකම් ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

වෘත්තීය ආචාරධර්මයන්හි මූලික මූලධර්මවලට අනුගතවීමට යාමේදී ආත්මාර්ථය පිළිබඳ තර්ජනය (threats), ස්වයං සමාලෝචනය මත තර්ජනය, පක්ෂව කතා කිරීම පිළිබඳ තර්ජනය, හුරුපුරුදුභාවය පිළිබඳ තර්ජනය, බිය ගැන්වීමේ තර්ජනය ආදි තර්ජනයන්වලට මුහුණපෑමට සිදුවේ. කෙසේවුවද, එබඳු තර්ජන අඩුකිරීමට හැකි හෝ ඉවත්කිරීමට හැකි ආරක්ෂක විධිවිධාන (safeguards) තිබේ.

(a) වැඩකරන පරිසරයේ නිර්මාණය කර ඇති ආරක්ෂක විධිවිධාන දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) වෘත්තීය (profession), ව්‍යවස්ථාව (legislation) සහ රෙගුලාසි මගින් (regulation) නිර්මාණය කර ඇති ආරක්ෂක විධිවිධාන තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

**අහි, භූමි** සහ **සුමි, ABS** නම් වූ හවුල්ව්‍යාපාරයේ හවුල්කරුවන් වේ. **සීමාසහිත XYZ සමාගම, ABS හවුල් ව්‍යාපාරයේ** තරඟකරුවෙකි. **සුමි, සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනෙකුට අල්ලසක් දී එම සමාගමේ සේවාදායකයන්ගේ රහස්‍ය තොරතුරු ලබාගෙන ඒ තොරතුරු මත පදනම්ව **ABS හවුල් ව්‍යාපාරයට** උපදෙස් දෙන ලදී. **සීමාසහිත XYZ සමාගමේ** අධ්‍යක්ෂවරයෙකුට **ABS හවුල් ව්‍යාපාරයේ** හවුල්කරුවෙකු විසින් අල්ලසක් දුන් බව දැනගෙන **සීමාසහිත XYZ සමාගම, ABS හවුල් ව්‍යාපාරයේ** සියලුම හවුල්කරුවන්ට විරුද්ධව නඩු පවරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මේ සම්බන්ධයෙන් **ABS හවුල් ව්‍යාපාරයේ** අනෙකුත් හවුල්කරුවන්ගේ වගකීම (liability) **විමසන්න**. (ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**නන්ද** 1990 වර්ෂයේදී "වීර පුරුෂයා" නම්වූ පොත ලියා ඒ සඳහා ප්‍රකාශන අයිතිය (copyright) ලබා ගන්නා ලද අතර, එම පොත පරිවර්තනය කිරීම සඳහා ඔහු විසින් **රංග** වෙත බලය (authorization) ලබාදෙන ලදී. එහෙත් 2000 වර්ෂයේදී **නන්ද** අභාවප්‍රාප්ත විය. පරිවර්තනය ප්‍රකාශයට පත්කිරීමෙන් පසු, **රංග** "වීර පුරුෂයා" යන නමින්ම අලුත් පොත් ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කරන ලදී. **නන්දගේ** දරුවන් ප්‍රකාශන අයිතියට වන නීතිය (copyright law) යටතේ **රංගට** විරුද්ධව නඩු පැවරීමට අදහස් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ, ප්‍රකාශන අයිතියට වන නීතිය මගින් ආවරණය කෙරෙන දෑ **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(b) ප්‍රකාශන අයිතියට වන නීතිය යටතේ **රංග** කිසියම් වගකීමකට (any liability) යටත් වන්නේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත රියෝ ලංකා පොදු සමාගමේ** ස්ථිර සේවකයන් වූ **තිමල්, මාලනී** සහ **ආශා**, 2017 ජූනි 30 දින සිට ක්‍රියාත්මක වනසේ, සමාගමෙන් ඉල්ලා අස්වූහ. ඔවුන් සේවක අර්ථසාධක අරමුදල් [Employees' Provident Fund (EPF)] ප්‍රතිලාභ ආපසු ලබාගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව, පහත සඳහන් එක් එක් කරුණ යටතේ ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන් ලබාගත හැකිදැයි හේතුද සහිතව **පැහැදිලි කරන්න**:

(a) **තිමල්,** වයස අවුරුදු 50 ට එළඹීමෙන් පසු, තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා, සමාගමෙන් ඉල්ලා අස්විය. (ලකුණු 03)

(b) **මාලනී,** 2017 දෙසැම්බර් මාසයේදී විවාහවීම සඳහා සමාගමෙන් ඉල්ලා අස්වූවාය. (ලකුණු 03)

(c) විදේශ රටක කොන්ත්‍රාත් පදනම මත රැකියාවක් ලැබීම නිසා **ආශා,** සමාගමෙන් ඉල්ලා අස්වූවාය. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

(a) **අමල්** සහ **අමාලි** 2012 වර්ෂයේදී විවාහ වූ අතර, 2016 දෙසැම්බර් මාසයේදී ඔවුහු වෙන්වූහ. ඔවුන් දික්කසාදය ලබා ගැනීම පිළිබඳව සිතමින් සිටී. ඔවුන්ගේ පුතාගේ උපන්දිනයේදී **අමාලිට** රු.50,000/- ක් බැගින් වූ මාසික ගෙවීමක් කිරීමට **අමල්** පොරොන්දු විය. **අමාලි** මෙය ලිඛිතව දෙන ලෙස ඉල්ලා සිටි අතර, පොරොන්දු වූ පරිදි ගෙවා නොසිටියහොත් ඇය ඔහු උසාවිය ඉදිරියට පමුණුවන බවද කීවාය. තුන්වන මාසය අවසානයේදී ඔහු විසින් ගෙවීම් සිදුකිරීම නවත්වන ලදී. **අමාලි** ඔහුට විරුද්ධව නඩු පවරන බව පවසන ලදී. **අමල්** ඒ ගැන ඇයට සුබ පැතූ අතර, කිසිම උසාවියකට සැමියා හා බිරිඳ අතර ගිවිසුමක් වලංගු කළ නොහැකි බව පවසන ලදී.

ඇයට මුදල් ගෙව්වේ ඇය කිසිවක් නොකර සිටිනු ඇතැයි සහ ආදරය සහ පවුලක් රැක බලා ගැනීම, ගිවිසුමක් සඳහා හොඳ ප්‍රතිඥාවක් නොවන බවත් ඔහු තවදුරටත් කියා සිටියේය.

**අමල්** සමඟ තර්ක කිරීමෙන් ඉතාමත් අපහසුතාවයට පත්වූ ඇය පුතාද සමඟ සාප්පු සවාරියක් ගියාය. පුතා ප්‍රදර්ශන කුටියක තිබූ අලුත්ම "ගැජට් මෑන්" සෙල්ලම් බඩුව සාප්පුවේ ප්‍රදර්ශන කවුළුවේ දැක එය මිලදීගෙන දෙන ලෙස **අමාලිගෙන්** ඉල්ලා සිටින ලදී. **අමාලි,** සාප්පුවේ ප්‍රදර්ශනය කර තිබූ "මිලෙන් අඩකට විකුණුමක්! - පැමිණ ඔබේ සෙල්ලම් බඩුව අත්පත් කරගන්න" යන ලේබලය දුටුවාය. අමාලි "ගැජට් මෑන්" සෙල්ලම් බඩුව අතට ගෙන එහි මිල පිළිබඳව විමසා සිටියාය. සාප්පුහිමියා කියා සිටියේ එහි මිල රු.20,000/- ක් වන බවත්, එය රු.15,000/- කට ලබාගත හැකි බවත්ය. **අමාලි** එම මිල ගැන සතුටු නොවූ අතර, ඇය සෙල්ලම්බඩුව ආපසු දුන්නාය. ඇය සාප්පුවෙන් බැහැර යාමට උත්සාහා කළාය. සාප්පුහිමියා කීවේ ඇයට එය ආපසු දිය නොහැකි බවත්, සෙල්ලම් බඩුව ඇය අතට ගත් අවස්ථාවේ එය මිලදී ගැනීමට ගිවිසුමකට එළැඹුනු බවත්ය.

පහත අය සම්බන්ධයෙන් **අමාලිගේ** නෛතික හිමිකම් (legal rights) **විමසන්න**:

(i) **අමල්.** (ලකුණු 07)

(ii) සාප්පුහිමියා. (ලකුණු 06)

(b) **පෙරේරා, සිල්වාට** කාර් රථයක් විකුණන ලදී. ඔහු කාර් රථය පිළිබඳව විස්තර කළේ එය BMW වර්ගයේ අලුත්ම මාදිලියේ රථයක් බවත්, මුල් තත්ත්වයෙන්ම පවතින බව හා පාවිච්චි නොකළ තරමේ එකක් වන බවත්ය. **සිල්වා** වහාම (outright) මුදල් ගෙවා රථය මිලදී ගන්නා ලදී. දින කිපයක් ධාවනය කිරීමෙන් පසු කාර් රථය කැඩුණේය. **සිල්වා** කාර් රථය ගරාජයකට රැගෙන යන ලදී. අළුත්වැඩියාකරු කියා සිටියේ එය ඉතාමත් නරක අයුරින් පාවිච්චි කළ මෝටර් රථයක් බවත් එහි එන්ජිම විනාශ කර ඇති අතර, අලුත් එන්ජිමක් නැවත යෙදිය යුතු බවත්ය. එසේම මෙය ඉතාමත් පැරණි මාදිලියේ මෝටර් රථයක් බවත් එම එන්ජින් එම සමාගමෙන් පවා තවදුරටත් නිෂ්පාදනය කෙරෙනවාදැයි ඔහුට සැකසහිත බවත් තවදුරටත් පවසන ලදී. එවිට **සිල්වා** කියා සිටියේ විකුණුම්කරු විසින් එය අලුත්ම මාදිලියේ රථයක්යැයි කියූ බවයි. අළුත්වැඩියාකරු සිනාසී, විකුණුම්කරුවන් ඕන දෙයක් කීවත් මිලදී ගැනීමට පෙර පරීක්ෂා කර බැලුවේනම් තත්ත්වය පහසුවෙන් අවබෝධ කරගත හැකිව තිබූ බවයි. මිලදී ගැනීමට පෙර එය අනිවාර්යයෙන්ම පරීක්ෂා කර බැලිය යුතුව තිබූ බව ඔහු විසින් අවධාරණය කරන ලදී.

පසුව, එදිනම නොදන්නා කෙනෙකු **සිල්වාට** දුරකතනයෙන් කතා කර ඒ තැනැත්තාගේ මෝටර් රථය ගරාජයක තිබෙනු දුටු බවද, එතැනින් **සිල්වාගේ** අංකය ලබාගත් බවද කියා සිටියේය. ගරාජයෙන් රථයේ හිමිකරු **සිල්වා** බව ඔහුට පැවසූ බවත් ඔහු **සිල්වා** ව පොලිසියට රැගෙන යන බවත් සහ ඔහු සොරෙකු බවත් පවසන ලදී. මවිතයට පත් **සිල්වා** ඇමතුම දුන් පුද්ගලයාට කතා කිරීමට තීරණය කරන ලදී. තමාට හිමිකමක් නොතිබූ කාර් රථයක් **පෙරේරා** විසින් තමාට විකුණා ඇති බව පසුව ඔහු වටහා ගන්නා ලදී. සත්‍ය හිමිකරු වූයේ **පෙරේරාගේ** මස්සිනා වූ ඔහුට ඇමතුම ලබා දුන් තැනැත්තාය.

ගැනුම්කරුවෙකු වශයෙන් **සිල්වාගේ** හිමිකම් (rights) සහ ඔහුට තිබෙන ප්‍රතිකර්ම (remedies) **විමසන්න**.

(ලකුණු 12)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |